# එක්සත් සමාජවාදී පක්ෂය
# ஐக்கிய சோசலிச கட்சி
# UNITED SOCIALIST PARTY

Sri lanka section of
the committee for a worker's international (CWI)

53/6 ඊ.ඩී දාබරේ මාවත
නාරාහේන්පිට, කොළඹ 5
53/ 6 ஈ. டி.தாபரேமாவத்தை
நாராஹென்பிட்டி கொழும்பு 05
Tel: 0114510289 /0112504647


සියලු වෘත්තිය සමිති දේශපාලන පක්ෂ
හා බහුජන සංවිධාන වෙත
හිතවත් සහෝදරයා/සහෝදරිය

## ජනතා අරගලයට දිශානතියක්

ගෝටාබය රාජපක්ෂ ජනාධිපතිවරයා ඇතුළු රාජපක්ෂ ආණ්ඩුවම ඉවත්වන ලෙස බලකරමින් රට පුරා ඇරඹි ජනතා අරගලය ගෝල්ෆේස් පිටියේ ජනාධිපති ලේකම් කාර්යාලය අසල කඳවුරු බැඳගැනීමත් සමග මේ වන විට රට පුරා ව්‍යාප්ත වෙමින් පවතී. මෙම ජනතා අරගලය කාලයක්පුරා රාජපක්ෂ පාලනයට එරෙහිව ජනතාව තුල කැකෑරෙමින් පැවති වෛරය පුපුරාඑළියට ඒමක් වන්නේය. එය ගෝල්ෆේස් පිටියට සීමානොවී සමස්ථ ලාංකීය ජනතාවගේ අරගලයක් බවට පත්ව ඇත්තේ එහෙයිනි. ජනතාව එකාවන්ව මේ ආකාරයෙන් පොදු ප්‍රගතිශීලී අරමුණක් වෙනුවෙන් පෙළ ගැසීම ඉතා වැදගත් සාධනීය වර්ධනයකි. කෙසේ වෙතත් මේ ජනතා අරගලය මේ අයුරින් දිගින් දිගටම පවත්වාගෙන යාම එතරම් පහසු කාරණයක් නොවේ. අනෙක් අතට ජනාධිපති වරයා ජනතා විරෝධය මායිම් නොකරමින් ඔහු සතුව ඇති ව්‍යවස්ථාමය බලය හරහා ඔහුට අභිමත පරිදි ඇමති මණ්ඩලයක පත් කරගෙන විධායකය පවත්වාගෙන යාමට කටයුතු කරමින් සිටින බව පෙනේ. මේ අතර රටේ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවද අවැසි පරිදි රැස් වෙමින් රටේ සාමාන්‍ය පාලනය පවත්වාගෙන යාම සඳහා අසාර්ථක උත්සාහයක යෙදී සිටිනු දැකිය හැකිය.

මෙම පසුබිම තුල දුර්වලබාවයට ඇදවැටී තිබෙන ගෝඨාභය පාලනය ජනතාවගේ ජනඅරගලය අවුල් කිරිම සඳහා සුපුරුදු පරිදි ජාතිවාදය ඇවිස්සීම සඳහා වියරු උත්සාහයක යෙදී සිටී. සිය කැමැත්තෙන් විදිබැස සිටින ජනතාවගේ අරගලය පිටුපස දෙමළ ඩයස්පෝරාව හා විදේශීය කුමන්ත්‍රණකරුවන් සිටින බව පෙන්වීමට රාජ්‍යපාක්ෂික ජඩමාධ්‍ය ගෙනයන ව්‍යාපාරය අඩුවෙන් තක්සේරු නොකල යුතුය. මෙයින් පෙනීයන්නේ රටේ ජනතාව විසින් සිදු කරන උද්ඝෝෂන තුළින් පමණක් මේ අරගලය ජයගැනීමට නොහැකි බවයි. වැඩකරන ජනතාවගේ මැදිහත්වීම මෙම අරගලය ජයගැනිම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. එම නිසා මෙම ජනතා අරගලය සාර්ථක කරගැනීම සඳහා වෘත්තීය සමිති වෙත මෙතෙක් කිසිඳු දිනක නොතිබූ ආකාරයේ සුවිශාල වගකීමක් පැවරී ඇත. මේ මොහොතේ රට තුළ ජන අරගලයක නිරතවන සියළුම ජනතාවට සහාය දක්වමින් වෘත්තීය සමිති ව්‍යාපාරය තීරණාත්මකව ඉදිරියට පැමිණිය යුතුව ඇති බව අපගේ අදහසයි.

මෙම අරගලය ඉදිරියට ගෙනයාම වෙනුවෙන් සියළු වෘත්තීය සමිති එක්ව වැඩවර්ජනයක් කැඳවියයුතු බව අප යෝජනා කරමු. එහි සැබෑ බලපෑමක් ඇති කළ හැකි වන්නේ 1953 හර්තාලයේදී මෙන් එවැනි වැඩ වර්ජනයක් මැදිකරගත් හර්තාල් ව්‍යාපාරයක් දියත් කිරීම තුළිනි. එහි පළමු පියවර වශයෙන් කොළඹ නගරයේ සියළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන වසා දමා, තොග වෙළඳ ආයතන ඇතුළු සියළුම ව්‍යාපාරික ස්ථානද වසා දමා පාසල් හා පොදු ප්‍රවාහන සේවා නතර කොට අවම වශයෙන් කොළඹ නගරය අකර්මන්‍ය කරන වැඩපිළිවෙලක් ගොඩනැගිය යුතු යයිද අපි යෝජනා කරමු. එමෙන්ම අනෙකුත් ප්‍රධාන නගරවලද මෙයට සමගාමීව හර්තාල් වැඩපිළිවෙල ව්‍යාප්ත කළ යුතුය.

මෙම තත්වය සමග ගෝලීය ධනවාදයට හා ජාතිවාදයට විරුද්ධ වමේ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් සියල්ල එකාබද්ධවී ධනපති රාජපක්ෂ පාලනය පලවාහැර විකල්ප සමාජවාදි වැඩපිළිවෙලක් ගොඩනැගීම වෙනුවෙන් සටන්වැදිය යුතුය. එකී වැඩපිළිවෙල සාර්ථක කිරිම සඳහා පෙරමුණට පැමිනෙන ලෙස වමේ සියලු බලවේග වලට අපි ආයාචනය කර සිටිමු. රටේ පවතින දරුණු අර්බුදකාරී තත්වයෙන් පීඩාවට පත් ජනතාවගේ ප්‍රකාශනයක් ලෙසින් ඇරඹි මේ ජන අරගලය සැබෑ ජයග්‍රනයක් දක්වා ඉදිරියට ගෙන යා හැක්කේ මෙවැනි ක්‍රියාකාරකම් සමුදායකින් බව අපගේ විශ්වාසය. ඒඅනුව මෙම අදහස ඔබ වෙත ඉදිරිපත් කරන අතර එය පෝෂනය කොට මේ අරගලය ජයග්‍රනයකින් අවසන් කිරීම සඳහා ක්‍රියා කරන ලෙස දේශපාලන පක්ෂ වෘත්තිය සමිති හා බහුජන සංවිධාන වලින් ඉල්ලා සිටිමු.

මෙයට, සහෝදරත්වයෙන්

සිරිතුංග ජයසූරිය
ප්‍රධාන ලේකම්
එක්සත් සමාජවාදී පක්ෂය 19/ 04 /2022